www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සාම සාකච්ඡාවල ඊළඟ වටය වැට උඩ

## Next round of Sri Lankan peace talks hangs in the balance

**කේ. රත්නායක විසිනි**

**2006 මාර්තු 16**

කොලඹ ආන්ඩුව සහ දෙමල ඊළම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර අප්‍රේල් 19-21 දිනවල ජිනීවාහි දී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකාවේ සාම සාකච්ඡාවල දෙවන වටය අවිනිශ්චිත තත්වයක පවතී. ආන්ඩුවේ සිංහල අන්තවාදී සගයන්ගේ වර්ගෝත්තමවාදී උද්ඝෝෂන ද එල්ටීටීඊයට එල්ල වී ඇති සන්නද්ධ ප්‍රහාර මාලාවක් ද සාකච්ඡා බිඳ වැටීමේ හැකියාව මතු කරයි.

2002 පෙබරවාරියේ දී අත්සන් කරන ලද වත්මන් බිඳෙනසුලු සටන් විරාමය වෙනස් කල යුතු යැයි කොලඹ ආන්ඩුව අවධාරනය කරන්නේ නම් තමන් සාකච්ඡාවෙන් නැගිට යන බවට එල්ටීටීඊය නියෝජිත කන්ඩායම තර්ජනය කිරිමත් සමග පෙබරවාරි 22-23 දිනවල ජිනීවාහි දී සාකච්ඡාවල පලමු වටය -- 2003 පෙබරවාරියේ දී අත්හිටුවීමෙන් පසුව ප්‍රථම වරට පැවති සාකච්ඡා -- බිඳවැටීමේ අද්දරට ම පැමිනියේ ය. තියුනු ජාත්‍යන්තර පීඩනයන් යටතේ දෙපාර්ශ්වය අප්‍රේල් මස තවත් සාකච්ඡා වටයක් පැවැත්වීමට අවසානයේ එකඟ විය.

එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව සහ එල්ටීටීඊය සටන් විරාමය උල්ලංඝනය නොකිරීමට පොරොන්දු වී ඇතැයි සාකච්ඡා අවසානයේ නිකුත් කෙරුනු කෙටි ඒකාබද්ධ ප්‍රකාශය තහවුරු කලේ ය. තමන් ලමා සොල්දාදුවන් බඳවා නොගන්නා බවට එල්ටීටීඊය ප්‍රකාශ කල අතර හමුදා පාලනය යටතේ පවතින ප්‍රදේශවල ආන්ඩු-හිතැති සන්නද්ධ කන්ඩායම් නිරායුධ කිරීමට ද ආන්ඩුව එකඟ විය. අප්‍රේල් මස යෝජිත හමුවේ දී සටන් විරාමය ක්‍රියාවට දැමීම ගැන සාකච්ඡා කිරීමට නියමිත ය.

පෙබරවාරි සාකච්ඡා මගින් දෙපාර්ශ්වය අතර පවත්නා පරතරයේ පුලුල් බව එලිදරව් විය. පසුගිය නොවැම්බරයේ දී මහින්ද රාජපක්ෂ ශ්‍රී ලංකාවේ ජනාධිපති ලෙස තේරී පත් වීමෙන් පසුව, දෙපාර්ශ්වයෙන් ම ප්‍රචන්ඩ ක්‍රියා උත්සන්න කෙරී ඇත්තේ සටන් විරාම ගිවිසුම අවලංගු ලියවිල්ලක් බවට ම පත් කරමිනි. දෙපාර්ශ්වය මොන යම් හෝ එකඟතාවකින් තොරව සාකච්ඡාවලින් නැගිට ගියේ නම්, එය යුද්ධය ප්‍රකාශ කිරීමකට සම වනු ඇත.

එතැන් පටන් පරතරය සැලකිය යුතු ආකාරයකින් පුලුල් වී තිබේ. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල අව්‍යක්ත සහයෝගය සහිතව එහි පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල ක්‍රියාත්මක වන සන්නද්ධ කන්ඩායම් නිරායුධ කිරීමට ආන්ඩුව අපොහොසත් වී තිබේ. ජිනීවා ප්‍රකාශයට ප්‍රතිචාර දක්වමින්, එක් සන්නද්ධ කන්ඩායම් නායකයකු වන, කරුනා නමින් ද හැඳින්වෙන, එල්ටීටීඊයෙන් බිඳී ගිය වී. මුරලිදරන් රොයිටර් ප්‍රවෘත්ති සේවයට කෙලින් ම මෙසේ පැවසී ය: "කෙලින් ම කිව හොත්, අප (එල්ටීටීඊයට) පැහැදිලිව ම කියා සිටින්නේ ආයුධ දැමීම අපේ අධිෂ්ඨානය හා සදාචාරමය අයිතිය බවයි."

එතැන් පටන් අඩු ගනනේ නැගෙනහිර දී එල්ටීටීඊයට එරෙහි ප්‍රකෝපකාරී ප්‍රහාර දෙකක් එල්ල වි ඇත. මාර්තු 4 දා, එල්ටීටීඊ භටයන් දෙදෙනෙකු මරනයට පත් කරමින් වවුනතිව්හි එල්ටීටීඊ මුර පොලකට ප්‍රහාරයක් එල්ල විය. ප්‍රහාරකයන් ඉන් මීටර් 300ක් දුරින් පිහිටි මිලිටරි මුර පොලකින් මතු වී ගැටුමෙන් පසුව අසල පිහිටි වවුනතිව් හමුදා කඳවුරට පසුබැස්ස බවට එල්ටීටීඊය චෝදනා කලේ ය.

තමන් එම සිද්ධියට කිසිදු සම්බන්ධයක් නැති බව මිලිටරිය ප්‍රකාශ කල අතර, නෝර්වේජියානු නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව මාර්තු 5 දා මෙසේ අනතුරු ඇඟවී ය: "මෙම ප්‍රහාරය සටන් විරාම ගිවිසුමට එරෙහි තවත් පහරක් මෙන් ම ජිනීවා සාකච්ඡාවෙන් නිකුත් කෙරුනු ඒකාබද්ධ ප්‍රකාශය කෙරෙහි දෙපාර්ශ්වයේ ම ඇති කැපවීමට දරුනු වලකැපීමක් ද වේ. මෙවන් ප්‍රහාර හා ඝාතන යලි සිදු වුව හොත්, සාකච්ඡාවල ඊලඟ වටය අවදානමේ බවට සටන් විරාම නිරීක්ෂන කමිටුව භීතියට පත්ව සිටී."

මාර්තු 11 දා තවත් ප්‍රහාරයක් සිදු විය. එල්ටීටීඊ සටන්කරුවන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කට්ටුමුරිප්පුහි පිහිටි මුර පොලකට එල්ල වූ ප්‍රහාරයක් ව්‍යර්ථ කලේ යැයි එල්ටීටීඊ ප්‍රකාශක දයා මාස්ටර් පැවසී ය. එල්ටීටීඊ සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් සිද්ධියට ප්‍රතිචාර ලෙස මෙසේ කියා සිටියේ ය: "ශ්‍රී ලංකා ආන්ඩුව දෙමල පැරා-මිලිටරි සංවිධාන නිරායුධ කිරීම ප්‍රතික්ෂේප

කරමින් මඩකලපුව දිස්ත්‍රික්කයේ අපගේ මිලිටරි මධ්‍යස්ථානවලට එරෙහි ප්‍රහාරාත්මක මිලිටරි මෙහෙයුම් දියත් කිරීමට ඔවුන්ට දිගට ම ඉඩ දෙන්නේ නම්, ජිනීවා සාම සාකච්ඡා දෑවැන්ත අන්තරායකට මුහුන දෙනු ඇත."

එමෙන් ම, එල්ටීටීඊය සමග මොන යම් හෝ එකඟතාවක් ඇති කර ගැනීමට විරුද්ධ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ජාතික හෙල උරුමය එල්ල කරන පීඩනයට ද ජනාධිපති රාජපක්ෂ මුහුන දී සිටී. සටන් විරාමය ව්‍යවස්ථා විරෝධී යැයි හෙලා දකිමින් එය සංශෝධනය කල යුතු යැයි ඉල්ලා සිටින මෙම පක්ෂ, ජිනීවාහි දී නිකුත් කෙරුනු ඒකාබද්ධ නිවේදනයට පහර ගසා ඇත. ඔවුහු, සාම ක්‍රියාදාමයේ නිල අතරමැදියා වන නෝර්වේ රාජ්‍යය "එල්ටීටීඊ-ගැති" බවට ද චෝදනා කරන අතර වෙනත් රටක් එහි තැන ගත යුතු යැයි ඉල්ලා සිටිති.

පලාත් පාලන මැතිවරනය මාර්තු 30දාට නියමිතව ඇති තතු යටතේ, ජවිපෙ සහ හෙල උරුමය යන දෙගොල්ල ම සිය වර්ගවාදී පූව්චානම් උත්සන්න කර තිබේ. පෙබරවාරි 26 දා නිකුත් කෙරුනු මාධ්‍ය නිවේදනයකින් හෙල උරුමය ප්‍රකාශ කරන්නේ, තමන් "(ඒකාබද්ධ) නිවේදනයේ කරුනුවලට අනුමැතිය දී නැති" බවයි. සටන් විරාමය පිලිගැනීම සම්බන්ධයෙන් ජිනීවා ප්‍රකාශය හෙලා දකිමින්, එය නෝර්වේ රටෙන් එල්ල වූ පීඩනයේ ප්‍රතිඵලය බව ද ජවිපෙ කියාපායි.

ජවිපෙ සහ හෙල උරුමය අස්වැසීමේ ප්‍රයත්නයක් ලෙස, ප්‍රමුඛ නීතිඥයකු හා ජිනීවාහි ආන්ඩුවේ නියෝජිත කන්ඩායමේ සාමාජිකයකු වූ එච්.එල්. ද සිල්වා කියාපෑවේ ඒකාබද්ධ නිවේදනය සටන් විරාමය "සංශෝධනයකට" සම වන බව යි. විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප), ජවිපෙ සහ හෙල උරුමය මෙන් ම එල්ටීටීඊය ද එම ලියවිල්ලට එලෙස කෘත්‍රිම ලෙස පැටවූ අර්ථදැක්වීම වහා ම ප්‍රතික්ෂේප කලේ ය.

මාර්තු 1 දා ටැමිල්නෙට් වෙබ් අඩවියට අදහස් දක්වමින් එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු බාලසිංහම් පැහැදිලි කලේ, "ජිනීවා සාකච්ඡාවලට පසුව පාර්ශ්වයන් විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ ප්‍රකාශය විකෘත කිරීමේ හා එයට වැරදි අර්ථකථන සැපැයීමේ ප්‍රයත්නය අන්‍යොන්‍ය විශ්වාසයට හානි පමුනුවා සාම ක්‍රියාදාමයට බැරෑරුම් ලෙස වල කපනු ඇති" බවට අනතුරු අඟවමින් ආන්ඩුවට පනිවිඩයක් යවා ඇති බව යි.

එජනිස මාර්තු 6 දා සියලු පාර්ලිමේන්තු පක්ෂවල ඒකාබද්ධ සමුලුවක් කැඳවීම මගින්, ජවිපෙ හා හෙල උරුමය සමග තමන්ට පවතින මතභේදවලට පැලැස්තර අලවා ගැනීමට උත්සාහ කලේ ය. එල්ටීටීඊයට හිතැති පාර්ලිමේන්තු සන්ධානයක් වන දෙමල ජාතික සන්ධානයට ආරාධනා කිරීමට රාජපක්ෂ අපොහොසත් වීම මගින් එම රැස්වීමේ වර්ගෝත්තමවාදී ස්වභාවය පැහැදිලි කෙරුනි.

ජවිපෙ සහ හෙල උරුමය සමුලුව යොදා ගත්තේ ජිනීවා සාකච්ඡාවලට පහර ගැසීමේ වේදිකාවක් ලෙස ය. "රටේ ස්වෛරී භාවයට හානිකර මොන යම් හෝ කොන්දේසියකට එකඟ වනවාට වඩා කිසිදු ප්‍රගතියක් අත්පත් කර ගැනීමකින් තොරව සාකච්ඡා මේසයෙන් නැගිට ඒම වඩා හොඳ" වීමට ඉඩ තිබිනැයි ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ අවධාරනය කලේ ය. සමස්ත සාකච්ඡා ක්‍රියාදාමය ම මත ප්‍රශ්නාර්ථයක් හෙලමින් ඔහු තව දුරටත් මෙසේ පැවසී යː "කොටි කිසිදාක ඔවුන්ගේ පුල්ලි වෙනස් කරගනු ඇතැයි අපි විශ්වාස නොකරමු."

"එල්ටීටීඊය සාකච්ඡා මේසයේ තබා ගත හැකි එකම ක්‍රමය වන්නේ සන්නද්ධ හමුදාවන් ශක්තිමත් කිරීම" යැයි අමරසිංහ ප්‍රකාශ කලේ, තව දුරටත් මෙසේ ද කියා සිටිමිනිː "ශක්තිමත් මිලිටරියක්, එල්ටීටීඊයේ බෙදුම්වාදී අභිලාෂයන් පාලනය කිරීමේ, එකම ක්‍රමය නොවේ නම්, වඩාම වැදගත් ක්‍රමය යි." පෙර පැවති ආන්ඩු "යලි යුද්ධයට යාමට කෙතරම් බිය වී ද යත් ඔවුන් එල්ටීටීඊයේ ඉල්ලීම්වලට යටත් වූයේ" යැයි එම ආන්ඩු හෙලා දැකි ඔහු "මෘදුව කතා කරන ගමන් තඩි පොල්ලකුත් අරගෙන යන" ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය.

තමන් දෙවැනි නොවනු පිනිස, හෙල උරුමයේ පාර්ලිමේන්තු නායක එල්ලාවල මේධානන්ද අනතුරු ඇඟවූයේ ආන්ඩුව සිය පොරොන්දුවලට බැඳී සිටීමට අපොහොසත් වුව හොත් සිය පක්ෂය එයට දෙන සහයෝගය ඉවත් කර ගන්නා බවට යි. නොවැම්බර් ජනාධිපතිවරන ව්‍යාපාරය තුල දී, රාජපක්ෂ, ජවිපෙ සහ හෙල උරුමය සමග, සටන් විරාමය සංශෝධනය කරන බවටත් අතරමැදි ක්‍රියාකලාපයෙන් නෝර්වේ ඉවත් කරන බවටත් දුන් පොරොන්දු ඇතුලත් මැතිවරන ගිවිසුම් අත්සන් කලේ ය.

2004 දී එල්ටීටීඊයෙන් බිඳී ගිය ඊනියා කරුනා කන්ඩායම නිරායුධ කිරීමේ ප්‍රයත්නයන්ට ද හෙල උරුමය නායකයා විරුද්ධ විය. "එල්ටීටීඊයට යුද්ධ කිරීමට නොහැකිව ඇත්තේ කරුනා කන්ඩායම නිසා" යැයි ඔහු පැවසී ය. "එනයින්, කරුනා කන්ඩායම වැදගත් අංගයකි."

ජවිපෙට හා හෙල උරුමයට අභියෝග කරනවා වෙනුවට, රාජපක්ෂ කලේ, සාකච්ඡා නිරීක්ෂනය කිරීමේ ක්‍රියාවට සහභාගි වනු පිනිස නියෝජිතයන් නම් කරන ලෙස සියලු පක්ෂවලින් ඉල්ලා සිටීම යි. "ජිනීවාහි දී එල්ටීටීඊය සමග සාකච්ඡාවල නිරත වන

කල ආන්ඩුවේ නියෝජිත කන්ඩායම මුහුන පෑ හැකි ගැටලුවලට විසඳුම් සපයා ගැනීමේ හැකියාව එමගින් අපට ලැබෙනු ඇත." යැයි ඔහු පැවසී ය. ජවිපෙ නායකයන් වන අමරසිංහ සහ විමල් වීරවංශ පසුගිය සාකච්ඡා වටය "නිරීක්ෂනය කිරීමේ" දූනටමත් යෙදී ඇත.

මේ එකක් වත් ජවිපෙ හා හෙල උරුමය අස්වැසීමට සමත් වී නැත. වීරවංශ මාර්තු 7 දා පාර්ලිමේන්තුවේ දී විශේෂ ප්‍රකාශයක් කියවමින් නෝර්වේ අතරමැදි ක්‍රියාකලාපයෙන් ඉවත් කල යුතු යැයි ඉල්ලා සිටියේ ය. ජිනීවා සාකච්ඡාවලින් පසුව ඔස්ලෝහි දී එල්ටීටීඊ නියෝජිත කන්ඩායම් පිලිගැනීම ගැන ඔහු නෝර්වේ ආන්ඩුව හෙලා දුක්කේ ය. "අපගේ ආස්ථානය වන්නේ, ත්‍රස්තවාදීන්ට පිටුබලය සපයන නෝර්වේ සහ ත්‍රස්තවාදීන්ට පිටුබලය සපයන මාධ්‍ය පරාජය කිරීමෙන් තොරව මව්බිම ආරක්ෂා කර ගත නොහැකි ය යන්න යි." යනුවෙන් වීරවංශ ගුගුලේ ය.

එල්ටීටීඊ දේශපාලන අංශ නායක එස්.පී. තමිල්චෙල්වම් ජවිපෙ ප්‍රකෝපකාරී ප්‍රකාශයට ප්‍රතිචාර දක්වමින් මෙසේ ප්‍රකාශ කලේ යඃ "දෙමල ජනතාව මත පරිපූර්න යුද්ධයක් පැටවීමෙහි ලා සිංහල අන්තවාදීන් සමත් වන්නේ නම්, එය අපගේ නායකත්වයට ගත හැකි තීන්දු බොහෝ සෙයින් සරල කරනු ඇත." තමන් යලි යුද්ධයට යාමට සූදානම් බවක් අඟවන අතර ම, කොලඹ ආන්ඩුව සමග සාම සම්මුතියක් කරා එලඹෙන ලෙස එල්ල කෙරුනු සැලකිය යුතු ජාත්‍යන්තර පීඩනයකට ද, විශේෂයෙන් ම එක්සත් ජනපදයෙන් එල්ල වන පීඩනයකට ද, එල්ටීටීඊය මුහුන දී සිටී.

පසු දින, අමරසිංහ සහ වීරවංශ රාජපක්ෂ හමු වී සටන් විරාමය සංශෝධනය කිරීම සහ නෝර්වේ ඉවත් කිරීම පිලිබඳ සිය ඉල්ලීම් අවධාරනය කලේ ය. දි අයිලන්ඩ් පුවත්පතට අනුව, ජවිපෙ නායකයෝ "-නොර්වේජියානු පහසුකම් සැලැස්වීම දිගටම පවත්වා ගෙන යාම විකාරයක් බව ප්‍රකාශ කලහ." ජනාධිපති කාර්යාලයේ නිලධාරියෙක් පුවත්පතට මෙසේ පැවසී යඃ "ආන්ඩුව දරුනු පීඩනයකට යටත්ව සිටී. අපි උභතෝකෝටිකයකට මුහුන දී සිටිමු. ජාත්‍යන්තර ප්‍රජාව නෝර්වේජියානු පහසුකම් සැලැස්වීම ගැන අවධාරනය කරන අතර පහසුකම් සලස්වන්නන් විස්ථාපනය කිරීමේ මොන යම් හෝ පියවරක් ඔවුන්ව අසතුටට පත් කිරීමට ඉඩ ඇත."

"ජාත්‍යන්තර ප්‍රජාව" නොතකා සිටීමක් රාජපක්ෂට දූරිය නොහැකි ය. මාධ්‍ය ඇමති අනුර ප්‍රියදර්ශන යාපා මාර්තු 9 දා සතිපතා මාධ්‍ය හමුවට මෙසේ පැවසී යඃ "දේශපාලන පක්ෂවලට කේන්තිය පිට කර ගන්න පුලුවන්. ඒත් ආන්ඩුවක් හැටියට අපගේ පිලිවෙතෙහි වෙනසක් සිදු වී නැහැ. නෝර්වේ අපගේ පහසුකම් සලස්වන්නා වනු ඇත." කෙසේ වෙතත්, පාලක එජනිස සිංහල වර්ගවාදය තුල කෙතරම් නම් ගැඹුරින් ම ගිලී පවතී ද කිය තොත් ජවිපෙ හා හෙල උරුමය විසින් ගෙන යනු ලබන උද්ඝෝෂනය සරලව නොතකා සිටීමක් එයට කල නොහැකි ය.

මෙම තියුනු ආතතීන් මධ්‍යයේ, නෝර්වේජියානු විශේෂ නියෝජිත එරික් සොල්හෙයිම් ඊලඟ සතියේ දී ශ්‍රී ලංකාවට පැමිනීමට නියමිත ය. ආන්ඩුව මුහුන දෙන දේශපාලන උභතෝකෝටිකය තව දුරටත් සංකීර්න කරමින් සහ රට යලි යුද්ධය කරා ඇද වැටීමේ තර්ජනය උත්සන්න කරමින් ජවිපෙ සහ හෙල උරුමය, වාර්ගික මනෝගතීන් තව දුරටත් අවුලුවාලීම පිනිස සොල්හෙයිම්ගේ සංචාරය ඩැහැ ගනු ඇති බවට සැකයක් නැත.